# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 13 ශ්‍රේණිය - 3 වන සතිය - මැයි 18 සිට 22 දක්වා

නිපුණතාවය 12 - තරඟකරී වෙළඳපොළට සහ ව්‍යාපරික සංවිධානවලට, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යෙදිය හැකි අයුරු ගවේෂණය කරයි.

**අංකිත ආර්ථිකය (Digital Economy)**

රටක ජනගහනය, සේවක සම්පත, ප්‍රාග්ධනය, ඉඩම් සහ ආර්ථික නියෝජනයන් එම රටේ හෝ ප්‍රදේශයේ ආර්ථිකය වේ. අංකිත ආර්ථිකයක් යනු මෙම සම්පත් භාවිතා කර භාණ්ඩ හා සේවාවන් විද්‍යුත් වාණිජ්‍ය ක්‍රම ඔස්සේ වෙළඳාම් කිරීම සහ පවත්වාගෙන යාමයි. අංකිත ආර්ථිකයේ පවත්නා ව්‍යාපාර වර්ග 3කි.

- **මාර්ග අපගත වෙළඳ සංවිධාන** - ගොඩනැගිල්ලක් තුළ තම භාණ්ඩ හා සේවා අලෙවි කරන සාම්ප්‍රදායික වෙළඳ සංවිධාන මෙම වර්ගයට අයත් වේ. පාරිභෝගිකයා සේවා ස්ථානයට පැමිණ භාණ්ඩ හා සේවා ලබා ගනී.

- **මාර්ග අපගත හා මාර්ගගත වෙළඳ සංවිධාන** - අන්තර්ජාලය ඔස්සේ මෙන්ම සාම්ප්‍රදායික ක්‍රමවේදය යන ආකාර දෙකෙහිම මිශ්‍රණයකින් යුක්තව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන ආයතන මෙම වර්ගයට අයත් වේ. භෞතික ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යන අතරම, අන්තර්ජාලය ඔස්සේ වෙබ් අඩවියක් උපයෝගී කරගෙන ද වෙළඳ කටයුතු වල නිරත වේ.

- **මාර්ගගත වෙළඳ සංවිධාන** - අන්තර්ජාලය ඔස්සේ පමණක් ව්‍යාපාරික කටයුතු සිදුකරන අතර භෞතික ගොඩනැගිල්ලක් භාවිතා නොකෙරේ. වර්තමානය වනවිට අඩු පිරිවැයකින් මෙම ව්‍යාපාර ආරම්භ කළ හැකි වී ඇත. මෙහි ප්‍රධාන අලෙවි කුටිය වන්නේ වෙබ් අඩවියකි.

1. ව්‍යාපාර සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගනු ලබන අවස්ථා මොනවාද ?